# ජගත් පරිසර දිනය නිමිත්තෙන් පවත්වනු ලබන කෙටි වීඩියෝපට නිර්මාණ තරගාවලිය

2026 ජූනි මස 05වන දිනට යෙදෙන ජගත් පරිසර දිනයට සමගාමීව මධ්‍යම පරිසර අධිකාරිය විසින් නෙස්ට්ලේ සමාගමේ අනුග්‍රාහකත්වය යටතේ කෙටි වීඩියෝ නිර්මාණ තරගාවලියක් ක්‍රියාත්මක කරනු ලබයි. පාරිසරික සංවිඥානය ඇති කරමින් පරිසර සංරක්ෂණ කාර්යය සඳහා මහජන සහභාගිත්වය ලබා ගැනීම උදෙසා නූතන සමාජ මාධ්‍ය වඩාත් සාධනීය මට්ටමින් උපයෝගී කර ගැනීමේ අරමුණින් මෙම තරගාවලිය පැවැත්වීමට කටයුතු කරනු ලබයි.

'නාගරීකරණය හා දේශගුණික වෙනස්වීම්: තිරසර අනාගතයක් සඳහා ප්‍රතිරෝධී නගර ගොඩනැගීම' කෙරෙහි දිශාගත වෙමින් 'Urgent Climate Action' යන තේමාව යටතේ 2026 ජගත් පරිසර දිනය සැමරීමට නියමිත ය. ඒ අනුව, දේශගුණ විපර්යාස ප්‍රබල පාරිසරික අර්බුදයක් වී තිබෙන වර්තමානයේ ඒ සඳහා කඩිනම් විසඳුම් සෙවීමේ අවශ්‍යතාව පවතින අතර විද්‍යාත්මක, තාක්ෂණික මෙන්ම අධ්‍යාපනික ප්‍රවේශයන් හරහා පියවර ගැනීම වඩාත් කාලෝචිත වේ.

අවිධිමත් අපද්‍රව්‍ය බැහැර කිරීම හා දහනය හේතුවෙන් වායුගෝලයට මුක්තවන මීතේන්, කාබන්ඩයොක්සයිඩ් වැනි හරිතාගාර වායූන් දේශගුණික විපර්යාස කෙරෙහි බලපාන බැවින් විධිමත් අපද්‍රව්‍ය කළමනාකරණය අත්‍යවශ්‍ය සාධකයක් වන අතර ඒ පිළිබඳ සමාජීය දැනුවත්භාවය ඇති කිරීම මෙම තරගය මගින් අපේක්ෂිතය.

## තරග තේමාව - 'නිසි අපද්‍රව්‍ය කළමනාකරණය තුළින් දේශගුණ විපර්යාස අවම කිරීමට දායක වෙමු'

## තරග කොන්දේසි

- කාලය තත්පර 60 (විනාඩි 01)
- MP4 file format එක භාවිත කළ යුතුයි.
- සිරස් පරිමාණයට නිර්මාණය කළ යුතුය. (Vertical) (1080X1920)
- ස්වනිර්මාණයක් විය යුතු අතර අන්‍ය නිර්මාණ පිටපත්, මුදල් ගෙවා ලබා ගත් නිර්මාණ පිටපත් ඉදිරිපත් නොකළ යුතුය.
- අවසර නැතිව සංගීතය හා වෙනත් වීඩියෝපටවල ඇතුළත් රූපරාමු භාවිත නොකළ යුතුය.
- වෙළඳ නාම, විශේෂිත ආයතන හෝ පුද්ගල නාම භාවිත නොකළ යුතුය.
- තිර පිටපත සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි භාෂාවෙන් ඉදිරිපත් කළ හැකිය.
- එක් තරගකරුවෙකුට/එක් කණ්ඩායමකට ඉදිරිපත් කළ හැක්කේ එක් වීඩියෝ පටයක් පමණි.
- කිසිදු පුද්ගලයෙකුට, ජන කොට්ඨාසයකට හෝ පාර්ශවයකට අයහපතක්, අගතියක් සිදුවන නිර්මාණ ප්‍රතික්ෂේප කරනු ලැබේ.
- ඩ්‍රෝන් යානා මගින් ලබා ගන්නා ලද වීඩියෝ දර්ශන සඳහා නිසි අවසර ලබා ගෙන තිබිය යුතු අතර යම් නීතිමය ගැටලුවක් ඇති වූ අවස්ථාවක නියමිත කාල වකවානු සඳහා ලබා ගත් අවසරපත් ඉදිරිපත් කිරීම සඳහා නිර්මාණකරුවන් ඕනෑම මොහොතක බැඳී සිටිය යුතුය.

- සංස්කරණ ඇතුළු නිර්මාණ කටයුතුවල දී AI සැකසුම් භාවිත නොකළ යුතුය.
- වීඩියෝපට ස්වයං නිර්මාණ බවට සහතික කර එවිය යුතු වේ.
- නිර්මාණය කරනු ලබන වීඩියෝ පට ceaepu79@gmail.com විද්‍යුත් ලිපිනය වෙත යොමු කළ යුතුවේ.
- **වීඩියෝපට යොමු කළ යුතු අවසන් දිනය 2026 මැයි 15 වන දින වේ**.
- විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසන් තීරණය වේ.

උපරිම කාල සීමාව ඉක්මවා යාම, Copyright ඇති සංගීතය අවසර නැතිව භාවිත කිරීම, නියමිත දින අවසන් වීමෙන් පසු ඉදිරිපත් කිරීම හෝ Video හෝ audio ගුණාත්මකභාවය ඉතා අවම මට්ටමේ තිබීම නිසා නැරඹිය නොහැකි වීම තරගයෙන් ඉවත් කිරීමට හේතු වේ.

නිර්මාණ හිමිකම සහ අයිතිය සැමවිටම නිර්මාණකරුට/නිර්මාණකරුවන්ට හිමිවන අතර ජයග්‍රාහී නිර්මාණ, අවශ්‍යවුවහොත්, ලාබ නොලබන අධ්‍යාපනික හා දැනුවත් කිරීම් වැඩසටහන් ඉදිරි ප්‍රචාරණ කටයුතු සඳහා යොදාගනු ලැබේ.

යම් තරග කොන්දේසියක් උල්ලංඝනය කරමින් එවා ඇති නිර්මාණ සම්බන්ධයෙන්, තරගය අවසන් වූ දින සිට වසර තුනක් ඇතුළත කාලයක් තුළ ලැබෙන්නා වූ පිළිගත හැකි සාක්ෂි පදනම් කරගත් නිර්නාමික නොවන සත්‍ය පැමිණිලි පමණක් සලකා බැලීම සිදුකරනු ලැබේ. ඒ සඳහා විශේෂඥ කණ්ඩායමක් විසින් සිදු කරනු ලබන විධිමත් විමර්ශන ඔස්සේ යම් හෙයකින් එවැනි කොන්දේසි කඩකිරීමක් සම්බන්ධයෙන් අනාවරණය වූයේ නම්, ලබා දී ඇති සම්මාන, සහතික හා ත්‍යාග අවලංගු කර නැවත ඒවා ලබාගැනීමට කටයුතු කරන අතර ඉදිරියේ දී පවත්වන තරග සඳහා වසර පහක කාලයකට නැවත එම තරගකරුවන්ට තරගයකට ඉදිරිපත් විය නොහැක. එසේම, ඔවුන් අසාදු ලේඛනගත කර ප්‍රචාරය කරනු ලැබේ.

## තරග කාණ්ඩ

පාසල් - කණ්ඩායම් අංශය (අට ශ්‍රේණියෙන් ඉහළ සිසුන්)
පාසල් - ඒකල අංශය (අට ශ්‍රේණියෙන් ඉහළ සිසුන්)
විවෘත අංශය (වයස අවුරුදු 18ට වැඩි)

## ඇගයීම් නිර්ණායක (Selection criteria)

- වීඩියෝව තේමාවට කොපමණ හොඳින් ගැළපේද යන්න. (Relevance to Theme)
- නවෝත්පාදක අදහස් සහ ඉදිරිපත් කිරීමේ විලාසය. (Creativity & Originality)
- Video quality, sound quality වැනි තාක්ෂණික ගුණාත්මකභාවය. (Technical Quality)
- ප්‍රේක්ෂකයන්ට ඇතිවන තොරතුරුමය බලපෑම/සමාජය වෙත ලබා දෙන පණිවිඩය (Impact on society)

**නිර්මාණකරුගේ තොරතුරු (විවෘත අංශයේ තරගකරුවන් සඳහා)**

සම්පූර්ණ නම - ..............................................................................................................................

උපන් දිනය - ..............................................................................................................................

ජාතික හැඳුනුම් පත් අංකය - ..............................................................................................................................

දුරකතන අංකය/අංක - ..............................................................................................................................

විද්‍යුත් ලිපිනය - ..............................................................................................................................

ලිපිනය - ..............................................................................................................................

මෙම නිර්මාණය මා විසින් සිදු කරන ලද ස්වයං නිර්මාණයක් වන බවත්, තරගයේ කොන්දේසිවලට එකඟ වන බවත්, අදාල කොන්දේසි උල්ලංඝණය වී ඇති බවට තහවුරු වුවහොත් විනිශ්චය මණ්ඩලය විසින් ගනු ලබන තීරණය/තීරණවලට එකඟ වන බවත් සහතික කර සිටිමි.

තරගකරුගේ නම ..............................................................................................................................

අත්සන ..............................................................................................

දිනය ..............................................................................................

## නිර්මාණකරුගේ තොරතුරු (පාසල් අංශයේ තරගකරුවන් සඳහා- ඒකල)

සම්පූර්ණ නම - ..........................................................................................................................................

දුරකතන අංකය/අංක - ..........................................................................................................................................

විද්‍යුත් ලිපිනය -..........................................................................................................................................

ලිපිනය - ..........................................................................................................................................

ශ්‍රේණිය - ..........................................................................................................................................

පාසලේ නම හා ලිපිනය - ..........................................................................................................................................

මෙම නිර්මාණය මා විසින් සිදු කරන ලද ස්වයං නිර්මාණයක් වන බවත්, තරගයේ කොන්දේසිවලට එකඟ වන බවත්, අදාල කොන්දේසි උල්ලංඝණය වී ඇති බවට තහවුරු වුවහොත් විනිශ්චය මණ්ඩලය විසින් ගනු ලබන තීරණය/තීරණවලට එකඟ වන බවත් සහතික කර සිටිමි.

තරගකරුගේ නම ..........................................................................................................................................

අත්සන ..........................................................................................

දිනය ..........................................................................................

**නිර්මාණකරුගේ තොරතුරු (පාසල් අංශයේ තරගකරුවන් සඳහා- කණ්ඩායම්)**

සම්පූර්ණ නම 1. ..........................................................................................................................................

2. ..........................................................................................................................................

3. ..........................................................................................................................................

4. ..........................................................................................................................................

5. ..........................................................................................................................................

සම්බන්ධ කර ගත හැකි දුරකතන අංකය/අංක - ........................................................................................

විද්‍යුත් ලිපිනය (එක් ලිපිනයක් ප්‍රමාණවත් වේ. ) - ..................................................................................

පාසලේ නම හා ලිපිනය - ...........................................................................................................................

මෙම නිර්මාණය අප විසින් සිදු කරන ලද ස්වයං නිර්මාණයක් වන බවත්, තරගයේ කොන්දේසිවලට එකඟ වන බවත්, අදාල කොන්දේසි උල්ලංඝණය වී ඇති බවට තහවුරු වුවහොත් විනිශ්චය මණ්ඩලය විසින් ගනු ලබන තීරණය/තීරණවලට එකඟ වන බවත් සහතික කර සිටිමු.

| | තරගකරුගේ නම | අත්සන |
|---|---|---|
| 1. | ....................................................................................... | ............................................................ |
| 2. | ....................................................................................... | ............................................................ |
| 3. | ....................................................................................... | ............................................................ |
| 4. | ....................................................................................... | ............................................................ |
| 5. | ....................................................................................... | ............................................................ |

දිනය ..........................................................................................